# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024 (2025)**

01. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2025 සැප්තැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025 ජුනි මස 30 දින වේ.**

**සටහන** - මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025 ජුනි මස 02** වැනි දින **පෙ.ව. 9.00ට** විවෘත වන අතර **2025 ජුනි මස 30** වැනි දින **ප.ව. 9.00ට අවසන් වේ.**

මෙම විභාගය උපලේඛනය - II හි දක්වා ඇති නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ. සියලු අයදුම්කරුවන් එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය තෝරාගත යුතු අතර මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - II අනුව නිවැරදිව සඳහන් කළ යුතුය.

02. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

03. (අ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඉ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

04. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු**. 48,470 - 10x540 - 11x630 - 10x1,010 - 10x1,190 – රු. 82,800/-** ක්

වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවාගනු ලබන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට නිලධාරියා යටත් විය යුතුය.

06. සුදුසුකම් : කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2007.06.30 දිනට හෝ ඊට පෙර හා 1995.06.30 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයකු ම රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

1. භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියලුම විෂයයන්ගෙන් එකවර සමත්ව තිබීම.

**සටහන -**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු මෙම තරග විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යය වේ.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට සමාන, වෙනත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන විභාගයකට පෙනී සිට ලබාගෙන ඇති සුදුසුකමක් පත්වීම ලබා දීම සඳහා අදාළ කර ගැනීම පිළිබඳ අවසන් තීරණය අදාළ අධ්‍යාපන ආයතනවලින් සහ විභාග කොමසාරිස් ජනරාල්වරයාගෙන් තහවුරු කර ගැනීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලැබේ.

**සැලකිය යුතුයි - සෑම අයදුම්කරුවකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025 ජුනි මස 30 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

07. **දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :** දිස්ත්‍රික් නාම ලේඛනය, උපලේඛනය - I ලෙස දක්වා ඇත. අයදුම්කරුවන් විසින් තමා පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උපලේඛනය - I අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී නිවැරදිව සඳහන් කළ යුතුය.

(අ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

I. යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

II. පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙළින් සුදුස්සන් තෝරනු ලැබේ.

III. විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

**සැලකිය යුතුයි - දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු ගණන යන්නෙන් අදහස් වන්නේ එම පරිපාලන දිස්ත්‍රික්කයේ ජනගහනයට අනුපාතිකව එම දිස්ත්‍රික්කයෙන් තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා වෙන් කරන පුරප්පාඩු ප්‍රමාණය වන අතර එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින රාජ්‍ය ආයතනවල ඇති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව නොවන බව සැලකිය යුතු වේ.**

(ආ) දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් - දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය:

I. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතුය;

*එසේ නැතහොත්*

II. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ඇය එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක්වත් (03) අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙකු විය යුතුය;

*එසේ නැතහොත්*

III. ඔහු/ඇය නොකඩවා අවුරුදු 05 ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

**සටහන -**

1. ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත් වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

   I. උප්පැන්න සහතිකය,
   II. ග්‍රාම නිලධාරි සහතිකය සහ අවුරුදු තුනක (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාම ලේඛනය,
   III. ශිෂ්‍ය කාර්ය දර්ශනය.

2. යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවයක නිරත වන බව සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.)

3. කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. මාර්ගගත අයදුම්පත යොමු කිරීමේ දී ඉහත 07(ආ) හි සඳහන් සුදුසුකම් අනුව තමන් පුරප්පාඩු සඳහා තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරාගත් පසු එය නැවත වෙනස් කළ නොහැක.

08. මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා

වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන, ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

**සටහන** - මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර **ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතු ය.**

09. විභාග පරිපාටිය :-

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | 100 | පැය 02 1/2 |
| 02 | අභියෝග්‍යතාවය | 100 | පැය 01 |

(01) **භාෂා හැකියාව :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

(02) **අභියෝග්‍යතාවය :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**සටහන :-** රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(ආ) මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

(ඇ) **විභාග ප්‍රතිඵල** - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය මගින් සිදුකෙරෙනු ඇත.

**10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

ii. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

**11. විභාග කොන්දේසි**

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. **සිංහලෙන් හෝ දෙමළෙන් සම්පූර්ණ කරන ලෙස උපදෙස් ලබා දී ඇති කොටස් පමණක් නිවැරදිව එම භාෂාවලින් සම්පූර්ණ කළ යුතු වේ.** මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර, කියවා, අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

**සටහන :** ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(iii) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් (E-mail) මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(iv) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(v) අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතුය.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(vii) අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් ද දැනුවත් කරනු ලැබේ. නිවේදනය පළවී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම තොරතුරු සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත සහ විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ix) විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ

නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(x) විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**12. විභාගයට ඇතුළත් කර ගැනීම**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

**සටහන :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.**

**13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 මැයි මස 20 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

උපලේඛනය - I

දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| වවුනියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොනරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

උපලේඛනය - II

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 01 | කොළඹ | කොටහේන | 01 |
| | | මරදාන | 02 |
| | | බොරැල්ල | 03 |
| | | කුරුඳුවත්ත | 04 |
| | | බම්බලපිටිය | 05 |
| | | හැව්ලොක් ටවුම | 06 |
| | | නුගේගොඩ | 07 |
| | | මොරටුව | 08 |

| අංකය | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| | | පිළියන්දල | 09 |
| | | හෝමාගම | 10 |
| | | මහරගම | 11 |
| | | හංවැල්ල | 12 |
| | | අවිස්සාවේල්ල | 13 |
| 02 | ගම්පහ | මීගමුව | 14 |
| | | මිනුවන්ගොඩ | 15 |
| | | දිවුලපිටිය | 16 |
| | | වේයන්ගොඩ | 17 |
| | | ගම්පහ | 18 |
| | | ජාඇල | 19 |
| | | වත්තල | 20 |
| | | කැලණිය | 21 |
| | | දොම්පෙ | 22 |
| 03 | කළුතර | හොරණ | 23 |
| | | පානදුර | 24 |
| | | කළුතර | 25 |
| | | මතුගම | 26 |
| | | අලුත්ගම | 27 |
| 04 | මාතලේ | මාතලේ | 28 |
| | | ගලේවෙල | 29 |
| | | නාඋල | 30 |
| | | ලග්ගල - පල්ලේගම | 31 |
| 05 | මහනුවර | මහනුවර | 32 |
| | | කටුගස්තොට | 33 |
| | | තෙල්දෙණිය | 34 |
| | | වත්තේගම | 35 |
| | | නුගවෙල | 36 |
| | | ගලගෙදර | 37 |
| | | ගම්පොළ | 38 |
| 06 | නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | | නුවරඑළිය | 40 |
| | | වතුමුල්ල | 41 |
| | | හැටන් | 42 |
| | | ගිනිගත්හේන | 43 |

| අංකය | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| 07 | ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | | ගාල්ල | 45 |
| | | බද්දේගම | 46 |
| 08 | මාතර | වැලිගම | 47 |
| | | මාතර | 48 |
| | | කඹුරුපිටිය | 49 |
| | | හක්මන | 50 |
| | | දෙයියන්දර | 51 |
| | | දික්වැල්ල | 52 |
| | | අකුරැස්ස | 53 |
| | | කොටපොල | 54 |
| 09 | හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | | වලස්මුල්ල | 56 |
| | | වීරකැටිය | 57 |
| | | තංගල්ල | 58 |
| | | අම්බලන්තොට | 59 |
| | | හම්බන්තොට | 60 |
| | | තිස්සමහාරාමය | 61 |
| 10 | යාපනය | වාවකච්චේරිය | 62 |
| | | යාපනය | 63 |
| | | තෙලිප්පල්ලෙයි | 64 |
| | | පේදුරුතුඩුව | 65 |
| 11 | මන්නාරම | මන්නාරම | 66 |
| | | මුරුක්කන් | 67 |
| 12 | මුලතිවු | මුලතිවු | 68 |
| 13 | වවුනියාව | වවුනියාව | 69 |
| 14 | ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | | ත්‍රිකුණාමලය | 71 |
| | | මුතූර් | 72 |
| | | පදවි පරාක්‍රමපුර | 73 |
| | | කින්නියා | 74 |
| 15 | මඩකලපුව | මඩකලපුව | 75 |
| | | එරාවූර් | 76 |
| | | කාතන්කුඩි | 77 |

| අංකය | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| 16 | අම්පාර | අම්පාර | 78 |
| | | සේරංකඩ | 79 |
| | | කල්මුණේ | 80 |
| | | අක්කරපත්තු | 81 |
| | | සමන්තුරේ | 82 |
| 17 | පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | | මාදම්පෙ | 84 |
| | | හලාවත | 85 |
| | | පුත්තලම | 86 |
| 18 | කුරුණෑගල | කුලියාපිටිය | 87 |
| | | බිංගිරිය | 88 |
| | | නාරම්මල | 89 |
| | | පොල්ගහවෙල | 90 |
| | | කුරුණෑගල | 91 |
| | | ඉබ්බාගමුව | 92 |
| | | දොඩම්ගස්ලන්ද | 93 |
| | | මොරතිහ | 94 |
| | | නිකවැරටිය | 95 |
| | | මහව | 96 |
| 19 | අනුරාධපුරය | මැදවච්චිය | 97 |
| | | කැකිරාව | 98 |
| | | අනුරාධපුරය | 99 |
| | | ගලෙන්බිඳුණුවැව | 100 |
| | | කහටගස්දිගිලිය | 101 |
| 20 | පොළොන්නරුව | පොළොන්නරුව | 102 |
| | | හිඟුරක්ගොඩ | 103 |
| 21 | බදුල්ල | බණ්ඩාරවෙල | 104 |
| | | වැලිමඩ | 105 |
| | | බදුල්ල | 106 |
| | | පස්සර | 107 |
| | | මහියංගනය | 108 |
| | | ගිරාඳුරුකෝට්ටේ | 109 |
| | | හසලක | 110 |

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 22 | මොනරාගල | බිබිල | 111 |
| | | මොනරාගල | 112 |
| | | වැල්ලවාය | 113 |
| 23 | කෑගල්ල | කෑගල්ල | 114 |
| | | රඹුක්කන | 115 |
| | | මාවනැල්ල | 116 |
| | | රුවන්වැල්ල | 117 |
| 24 | රත්නපුර | ඇහැලියගොඩ | 118 |
| | | රත්නපුර | 119 |
| | | පැල්මඩුල්ල | 120 |
| | | බලංගොඩ | 121 |
| | | කලවාන | 122 |
| | | ඇඹිලිපිටිය | 123 |
| 25 | කිලිනොච්චිය | කිලිනොච්චිය | 124 |
| | | පලෙයි | 125 |

05-183